# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1897/12 - 2015 ජනවාරි මස 16 වැනි සිකුරාදා - 2015.01.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 වැනි ව්‍යවස්ථාවේ 13(ආ) අනුව්‍යවස්ථාව යටතේ පුරප්පාඩුවක් පිරවීම

අංක 18 - පොළොන්නරුව මැතිවරණ කොට්ඨාසය සඳහා 1988 අංක 15 දරන පනතින් සංශෝධිත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 62 වැනි වගන්තිය යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස තෝරා පත් කර ගන්නා ලද බව ප්‍රකාශයට පත් කරන ලද පල්ලේවත්ත ගමරාළලාගේ මෛත්‍රීපාල සිරිසේන මහතා ඉල්ලා අස්වීම හේතුකොට ගෙන හත්වන පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව, ඉහත කී පනතේ 64(1) වැනි වගන්තිය යටතේ පාර්ලිමේන්තුවේ මහලේකම් විසින් මා වෙත දැනුම් දී ඇති හෙයින් ද,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 වැනි ව්‍යවස්ථාවේ 13(ආ) අනුව්‍යවස්ථාව යටතේ විධිවිධාන සලස්වා ඇති පරිදි මෙම පුරප්පාඩුව පුරවන ලෙස එකී මන්ත්‍රීවරයා තෝරා පත්කර ගන්නා ලද මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධාරියාට ඉහත කී පනතේ 64(1) වැනි වගන්තිය යටතේ මා විසින් විධාන කරනු ලැබූ හෙයින් ද,

තේරීම්භාර නිලධරයා විසින් එකී පනතේ 64(2) වැනි වගන්තිය යටතේ ක්‍රියාකරමින් එකී මැතිවරණ කොට්ඨාසය සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස ජයසිංහ බණ්ඩාර මහතා තෝරා පත් කරන ලද බව ප්‍රකාශයට පත්කර, එම පනතේ පළමුවන උපලේඛනයේ “ක” ආකෘතිය මත වාර්තාව ඉදිරිපත් කොට ඇති හෙයින් ද,

මැතිවරණ කොමසාරිස් මහින්ද දේශප්‍රිය වන මම, එකී පනතේ 64(2) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් ඉහත කී පල්ලේවත්ත ගමරාළලාගේ මෛත්‍රීපාල සිරිසේන මහතා ඉල්ලා අස්වීම හේතුකොට ගෙන ඇති වූ පුරප්පාඩුව පිරවීම පිණිස අංක 18 - පොළොන්නරුව මැතිවරණ කොට්ඨාසය සඳහා හත්වන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු ලෙස ජයසිංහ බණ්ඩාර මහතා තෝරා පත් කළ බව ප්‍රකාශයට පත්කරන ලද බව මහජනයා වෙත මෙයින් දන්වා සිටිමි.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

2015 ජනවාරි මස 16 වැනි දින,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය.

01-698


1A - G 20862 — 377 (2015/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.